# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,924/3 — 1970 සැප්තැම්බර් 21 වැනි සඳුද — 1970.9.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1970 අංක 293 දරන ආඥාව

යොමු අංකය : ජේ 69/70 ඩී. 626 / කිව. අයි. 165

1964 අංක 28 දරණ ඉඩම අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම හා ඉඩම ඇමති හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම ඇමති.

කොළඹ, 1970 සැප්තැම්බර් 20 වෙනිද.

### උපලේඛනය

| I<br>ඉඩම අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති ... | කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රදේශයේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 36 දරණ කුරුඳුවත්ත කොට්ඨාශයේ ටොරිංටන් පෙදෙසේ වරිපනම් අංක 25 දරන 80 සමාජ ශාලාව නැමැති ප්‍රමාණයෙන් අක්. 1, රූඩ් 1 පර්චස් 05.06 ක් වූ පහත සඳහන් මායිම්තුළ පිහිටි ඉඩම :—<br>උතුරට ... පාර සහ අංක ඒ. 890 දරණ මූලික සැලැස්මේ අංක 1 දරන බිම් කට්ටිය ;<br>නැගෙනහිරට... අංක ඒ. 890 දරණ මූලික සැලැස්මේ අංක 1 දරණ බිම් කට්ටිය සහ ටොරින්ටන් පෙදෙසේ වරිපනම් අංක 27 දරන ඉඩම ;<br>දකුණට ... ටොරින්ටන් පෙදෙස සහ ටොරින්ටන් පෙදෙසේ වරිපනම් අංක 27 දරන ඉඩම ;<br>බටහිරට ... ටොරින්ටන් පෙදෙස සහ පාර. |

9—1087


ලංකාණ්ඩුවේ මුද්‍රණදෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

622/3—ජේ 17146—5,725 (70/9)